

පොටෝ එකක් තියෙනවා. ලබන සුමානෙ එන කොට ගේන්නම්කො

පොරොන්දු වූ පරිදි අනිල් ඊළඟ සතියේ එනවිට එම ඡායාරූපය ගෙනාවේය. සිනිඳු කවරයක බහා තිබුණු ඡායාරූපය එලියට ගනිද්දී අපට පුදුම සිතුණි. එය විශාල ප්‍රමාණයේ මංගල ඡායාරූපයකි. සැබැවින්ම ඇය ඉතා රූමත්ය. වාඩිවී සිටින ඇගේ උරහිස මත එක අතක් තබා ගෙන සුන්දර ලෙස සිනාසී සිටින අනිල් ගේ දෑස දීප්තිමත්ය. සතුට උතුරා පිටාර ගලන සෙයකි. අප අසල සිට ඡායාරූපය දෙස බලා සිටින අනිල් ගේ දෑස දුක්බරය. මම එය ආපසු කවරයට දමා ඔහු අතට දී එතැනින් ඉවත්ව ගියෙමි. දින සති ගෙවී යන අතර ඉරීදා සුපුරුදු දුරකථන ඇමතුම් වලින් පසු ඔහු වඩ වඩාත් නොසන්සුන් බවක් පෑවේය. බිරිඳට දරුවා ලැබෙන්නට ආසන්න වෙමින් පැවතීම ඊට හේතුව යයි මම අනුමාන කලෙමි. ඒ අතර තමා වැඩ කරන තැන සිදුවන යම් යම් දේ ගැනද ඔහු තරමක නොපැහැදීමකින් සිටින බව සිරි සමග කරන කතා බහෙන් පැහැදිලි විය.

අපේ මිනිස්සු නම් කවදාවත් හදන්න බෑ අයියෙ. හැදෙන්නෙත් නෑ. බලන්න. මේ රටේ දවසකට කොච්චර මුදලක් ගෙවනවද? සමහරුන්ට ලංකාවෙ මාසෙම පඩිය තරම් මුදලක්. ඒත් හොරයක් බොරුවක් වංචාවක් නැතුව එහෙම ගෙවන තැනටවත් වැඩ කරන්න අපේ මිනිස්සුන්ට බැහැනෙ. අපේ වැඩපලේ මැෂින් වල වැඩ කරන අයට කරන්න තියෙන්නෙ බොහොම සුළු වැඩක්. කැපිල එන කෑල්ලෙ පළුදු තියෙනවද කියල බලල තෝරල දාන්න. මැෂින් එකෙන් ඒව හෙමිහිට එක කොලිට් එකකට හැදිල එන්නෙ. අපේ රෑ වැඩ කරන මිනිස්සු කරන්නෙ මොකද්ද කියල දන්නවද? මැෂින් එකේ වේගෙ වැඩි කරල පැය හයෙන් හදන කෑලි පැය දෙකෙන් හදල ඉතුරු පැය හතර නිදා ගන්නව. හුඟක් වෙලාවල රෑ ඇහැරල ඉන්නෙ මං විතරයි. මටත් තව කොච්චර කල් එහෙම ඉන්න පුළුවන් වෙයිද මංද. මොකද අනිත් අයට ඒක රුස්සන්නෙ නැහැ. අනිල් කතා කරන්නේ බලවත් කලකිරීමකිනි. එක් ඉරිදාවක චාපා සමග කුඩා සෙල්ලම් පියානෝවක යතුරු ඔබමින් සිටි අනිල් හදිසියේම හිස ඔසවා සිරි ඇමතීය.

අයියෙ, මට හිතයි ලංකාවට යන්න.

ගහෙන් ගෙඩි එන්නාක් වැනි වු ඒ කතාව නිසා අපි විමතියට පත් වුනෙමු.

ඒ මොන මෝඩ වැඩක්ද? මෙච්චර වියදම් කරගෙන ඇවිල්ලත්? ඇරත් තාම අවුරුද්දක්වත් නැහැනෙ. කීයක් වත් ඉතුරු කරගෙන යන්නෙ නැතුව?

සුනිලට බබා ලැබෙන්න තව මාසෙකට වඩා නැහැ. අනිල් අසරණ විලාසයක් පෑවේය. අනිල් ගියෙ නැතුවට අම්මල හැම දේම බලා ගන්නවනෙ.

මම ඔහුගේ හිත හැදීමට උත්සාහ කලෙමි.

අයියලට තේරෙන්නෙ නැහැ. මේ හුරතල් බබාල එක්කම ඉන්න නිසා. ඒත් තමන්ගෙ දරු පැටවුන්ගෙ පුංචි කාලෙ එයාලත් එක්ක ඉන්නෙ නැත්නම්, ඒ හුරතල් බලන්නෙ නැත්නම් ඒ තාත්ත කමෙන් ඇති වැඩක් තියෙනවද? ළමයි ලොකු වුනාට පස්සෙ අපි කොච්චර සල්ලි අරන් ගියත් ඒ සන්තෝසෙ ලැබෙන්නෙ නැහැනෙ අයියෙ. සිරි මා දෙස බැලුවේය. අපි දෙදෙනාම අනිල්ගේ කතාව ඉදිරියේ නිරුත්තර වීමු.

වීසා රහිතව රැ දී සිටින කෙනෙකුට හිතුණ විටෙක රටින් පිට වීමට අවකාශ නැත. අනිල් ඊළඟ සති දෙක තුනේ රටින් පිටවීමේ අයදුම් පත් පුරවා ඊට අදාල අනිකුත් අවශ්‍යතා සපුරාලීමේ යුහුසුළු වූයේ කෙසේ හෝ බිරිඳට දරුවා ලැබීමට පෙර ගෙදර යාමට සමත්විය. පිටත්ව යනදා සිරි ඔහු ගුවන් තොටුපොලට ගෙන ගොස් ඇරලුවේය. අනිල්ගේ නික්ම යාම අපේම සහෝදරයෙකුගේ වෙන්වීමක් සේ දැනුණි. ඔහු ලංකාවට ගොස් ටික කලක් යන තුරු ලිපි, දුරකථන ඇමතුම් හුවමාරු වුවද ක්‍රමයෙන් ඒවා නතර විය. දෙපැත්තේම අවිවේකී බව ඊට හේතු වූවා විය හැක.

ඊට අවුරුදු තුනකට පමණ පසු අගෝස්තු පාසැල් නිවාඩුවේදී අපි සැවෙංම ලංකාවට ගියෙමු. මගී පර්'යන්තයෙන් එලියට ආ අපි සිරිගේ මස්සිනා කොහිදැයි වටපිට බැලුවෙමු. අප එන හැම වතාවකම ඔහු ගමේ සිට සිය වාහනයෙන් අප කැඳවාගෙන යමට එයි. අයියේ යි පුරුදු හඬකින් අමතනු ඇසුණෙන් අපි දෙදෙනාම එදෙස බැලීමු. සෙනඟ පීරාගෙන අතක් ඔසවා ගෙන අප වෙත දිව එමින් සිටියේ අනිල්ය. සුදු කමිසයකින් හා කලිසමකින් සැරසී සිටි ඔහු ගේ මුහුණ සිනාවකින් පිරී ඇත.

ඈත ඉඳන් එකපාරට අයියව දැක්ක හැටියෙ පුදුම හිතුණ. මග ඇරෙන්න කලින් කතා කරන්න බැරිවෙයි කියල බයේ දුවං ආවෙ. ඔහු හතිලමින් කතා කරයි. දියණියන්ගේ හිස් මුදුන්ද වරින් වර අත ගායි.

අනිල් දැං මොකද කරන්නෙ?

ටුවරිස්ට් හයර්'. නරක නැහැ. එන කොට ගෙනාව සල්ලි ටිකෙන් වෑන් එකක් ගත්ත. අර තියෙන්නෙ.

ඔහු අත දිගු කොට ඈත නවතා ඇති වැන් රථයක් පෙන්වයි. එහි ඉදිරිපස වීදුරුවේ ලොකු අකුරින් සුදු පුතා යයි ලියා ඇත.

මට දැන් පුතෙකුත් ඉන්නවනෙ. ඔහු සිනාසෙමින් කියයි.

මම ඔහුගේ මුහුණ දෙස ඔනෑකමින් බැලීමි. ඒ මුහුණෙන් සතුට පිටාර ගලයි. ජපානයේදී දුටු අනිල්ගේ මුහුණේ එවන් සතුටක් දැවටී තිබෙනු මම කිසි දිනෙක නොදුටුවෙමි. ලංකාවෙන් පිටවී යාමට පෙර ඔහුගේ බිරිඳ සහ දරුවන් දැක බලා ගැනීමට එන බව කියා අපි ඔහුගෙන් සමුගතිමු. අප නොපෙනී යන තුරුම අත වනමින් සිටින අනිල්ගේ ඡායාව වාහනයේ පිටුපස වීදුරුවේ දුවිලි තට්ටුව අතරින් වරින් වර හැරී බැලූ අපට පෙනුණි.



# ස්වර්ණ පද්ම සම්මාන උත්සවය

ස්වර්ණ පද්ම සංසදය පසුගිය වසරේ පැවැත්වූ කෙටිකතා තරඟයේ ජයග්‍රාහකයින්ට සම්මාන පිදීමේ උත්සවය 2006 අප්‍රියෙල් මස 17 වන සඳුදා සවස 6.00 ට ඩීකින් සරසවියේ බර්වුඩ් මණ්ඩපයේ දේශන ශාලා අංක 1 හිදී පැවැත්වේ.

එදිනට 2005 වසරේ ශ්‍රී ලංකා චිත්‍රපට සංස්ථාව පැවැත්වූ කෙටි චිත්‍රපට තරඟයෙන් තේරුණු හොඳම කෙටි චිත්‍රපට දහය ප්‍රදර්ශණය කිරීමටද ස්වර්ණ පද්ම සංසදය කටයුතු යොදා ඇත.

සාහිත්‍යකාමී ඔබ සෑමගේ පැමිණීම ගෞරවයෙන් අපේක්ෂා කරමු.
ස්වර්ණ පද්ම සංසදය
විමසීම්
9801 9905
9799 6308




